1485

මගේ අංකය
නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය,
බදුළුඔය/ බත්මැඩිල්ල ව්‍යාපාරය,
කන්දකැටිය.
2018/04/27

සියළුම ව්‍යාපාර කමිටු
සාමාජික මහත්ම මහත්මීන් වෙත,

**ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම - 2018 අප්‍රේල් මාසය**

බදුළුඔය/ බත්මැඩිල්ල ව්‍යාපාරයේ මාසික ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම 2018/04/27 වන දින පෙ.ව.9.30ට කන්දකැටිය වාරිමාර්ග ශ්‍රවණාගාරයේ දී පැවැත්විය.

**සහභාගී වූ රජයේ නිළධාරීන්**

| | නම | තනතුර සහ ආයතනය |
|---|---|---|
| 01. | එස්.එච්.එල්.දයාපාල මයා | -නේවාසික ව්‍යාපාර කළමණාකරු, නේ.ව්‍යා.කළ.කාර්යාලය |
| 02 | වයි.එම්.එස්.එස්.යාපා මයා | -සංවර්ධන සහකාර, නේ.ව්‍යා.කළ.කාර්යාලය |
| 03 | ජී.ඩබ්.එස්.එස්.කේ.කුලතිලක මිය | -කළමනාකරණ සහකාර, නේ.ව්‍යා.කළ.කාර්යාලය |
| 04 | එස්.ඩී.මොලගොඩ මයා | -වාරිමාර්ග ඉංජිනේරු, වාරිමාර්ග කාර්යාලය |
| 05 | ආර්.එම්.සී.පී.රත්නායක මයා | -ඉංජිනේරු සහකාර, වාරිමාර්ග කාර්යාලය |
| 06 | ඩබ්.එම්.ආර්.ඒ.වීරසූරිය මයා | -ඉංජිනේරු සහකාර, වාරිමාර්ග කාර්යාලය |
| 07 | ආර්.එම්.පී.මධුසංක මයා | -තාක්ෂණික සහයක, වාරිමාර්ග කාර්යාලය |
| 08 | ආර්.එම්.ජානක මයා | -තාක්ෂණික සහයක, වාරිමාර්ග කාර්යාලය |
| 09 | ඩී.වී.එල්.එම්.දහනායක මයා | -තාක්ෂණික සහයක, කෘෂිකර්ම උපදේශක කාර්යාලය |
| 10 | එච්.එම්.ජීවානි දමයන්ති මිය | -වැල්ඩ්යු ඇන්ඩ වෝකර් සමාගම |
| 11 | එච්.පී.එස්.ප්‍රියංකර මයා | -වැල්ඩ්යු ඇන්ඩ වෝකර් සමාගම |

සහභාගී වූ ගොවි සංවිධාන නිළධාරීන්

| | නම | තනතුර සහ ගොවි සංවිධානය |
|---|---|---|
| 01 | ආර්.එම්.ජයසේන මයා | -ගරු සභාපති, දිලෙනතරු ගොවි සංවිධානය |
| 02 | ආර්.එම්.සෙනෙවිරත්න මයා | -ගරු සභාපති, සුචරිත ගොවි සංවිධානය |
| 03 | ඩබ්.එම්.ජයවර්ධන මයා | -ගරු සභාපති, සමගි ගොවි සංවිධානය |
| 04 | ආර්.එම්.පොඩිමහත්තයා | -ගරු භාණ්ඩාගාරික, සමගි ගොවි සංවිධානය |
| 05 | ජ්.ජේ.එම්.වීරතුංග මයා | -ගරු ලේකම්, පැරකුම් ගොවි සංවිධානය |
| 06 | ආර්.එම්.උබෙසේකර මයා | -ගරු සභාපති, පැරකුම් ගොවි සංවිධානය |
| 07 | ආර්.එම්.ලොකුබංඩා මයා | -ගරු ලේකම්, ගැමුණු ගොවි සංවිධානය |
| 08 | ඩී.එම්.සුගතපාල මයා | -ගරු භාණ්ඩාගාරික, එක්සත් ගොවි සංවිධානය |
| 09 | ආර්.එම්.තිලකරත්න මයා | -ගරු සභාපති, වීර උදාර ගොවි සංවිධානය |
| 10 | ජී.එම්.සුරසේන මයා | -ගරු භාණ්ඩාගාරික, ගැමුණු ගොවි සංවිධානය |
| 11 | ඩී.එම්.ජයසුන්දර මයා | -ගරු සභාපති, ගැමුණු ගොවි සංවිධානය |
| 12 | එම්.වීරසිංහ මයා | -ගරු ලේකම්, වීර පැරකුම් ගොවි සංවිධානය |
| 13 | ඩී.එම්.සුනිල් ප්‍රේමරත්න මයා | -ගරු සභාපති, වීර පැරකුම් ගොවි සංවිධානය |
| 14 | ජේ.එම්.වීරකෝන් මයා | -ගරු ලේකම්,වීර කැප්පෙටිපොල ගොවි සං. |
| 15 | බී.එච්.එම්.පියදාස මයා | -ගරු භාණ්ඩාගාරික, ගජබා ගොවි සංවිධානය |
| 16 | ඩී.එම්.ජේ.අබෙවික්‍රමසිංහ මයා | -ජල පාලක, බත්මැඩිල්ල |
| 17 | ඩී.එම්.ගුණපාල මයා | -ජල පාලක, බදුළුඔය |
| 18 | ආර්.ඩබ්.එම්.කුමාරසිංහ මයා | -ගරු ලේකම්, සුචරිත ගොවි සංවිධානය |
| 19 | ආර්.එම්.වීරසිංහ මයා | -ගරු භාණ්ඩාගාරික, සුචරිත ගොවි සංවිධානය |
| 20 | බී.ජනනාථ සිරිවර්ධන මයා | -ගරු ලේකම්, වීර උදාර ගොවි සංවිධානය |

| | වග කිවයුතු ආයතනය හා නිළධාරියා |
|---|---|
| <u>පිළිගැනීම හා ආගම සිහි කිරීම</u> | |
| ආගම සිහි කිරීමෙන් අනතුරුව නව වසරට සුභ පතමින් පැමිණ සිටි සියළුදෙනා පිළිගන්නා ලදි.<br>ඉන් අනතුරුව කන්න රැස්වීම් වාර්තාව සමාලෝචනය කරන ලදි. | නේවාසික ව්‍යාපාර කළමණාකරු |
| එහි සංශෝධන නොවූ අතර ගොවි සංවිධාන නිළධාරීන් හැඳින්වීමෙ දී වාර්තාවේ අදාළ ස්ථාන වල සංශෝධනයන් සිදුවිය යුතු බව කීය. | ගොවි සංවිධාන නිළධාරීන් |
| **01.** <u>ආයතන සංවර්ධන කටයුතු</u> | |
| • *ගොවි සංවිධාන රැස්වීම් පැවැත්වීම*<br>මෙම වසරට නියමිත ගොවි සංවිධාන නිලවරණ ජුනි, ජූලි වන විට පවත්වා අවසන් කළයුතු බව සඳහන් කළේය.<br>තවද, කාරක සභා හා මහ සභා පැවැත්වීමේ වැදගත්කම පිළිබඳ පැහැදිළි කරන ලදි. | සංවර්ධන සහකාර |
| • *ගිණුම් විගණනය*<br>2017 වසරට අදාළව විගණන කටයුතු මෙතෙක් සිදුකර නැති බවත්, එම විගණන කටයුතු සිදුකරගැනීමට මැයි මස 03 දින සියළු මූලා තොරතුරු පොත් පත් රැගෙන කාර්යාලයට පැමිණෙන ලෙසටත් දැනුම් දෙන ලදි. | |

| | |
|---|---|
| • ***පුහුණු වැඩසටහන්***<br>ජල දිනයට සමගාමීව විවාද තරඟයක් පැවැත්වූ අතර එහිදී ගොවි සංවිධාන මට්ටමින් සහභාගීත්වය අවම වීම පිළිබඳවත්, මාර්තු 29, 30 දිනයන්හි දී පැවැත්වූ සමස්ත ලංකා ගොවි සංවිධාන මහ සභා රැස්වීමත් සහභාගී වූ හා සහය දැක්වූ සියළුම දෙනාට ස්තූතිය ප්‍රකාශ කරන ලදි. | සංවර්ධන සහකාර |
| තවද, මෙහෙයුම් නඩත්තු ගිණුම් පිළිබඳ පැහැදිළි කළ අතර, ගොවි සංවිධාන වලින් එම තොරතුරු ලබාදීම නිසි ලෙස සිදුව නැති බව පවසමින්, ඒවා ලබාදෙන ලෙස දැනුම් දුනි.<br>විශේෂ අවස්ථා වලදී ගොවි සංවිධාන නිළධාරීන්ගේ සහභාගීත්වය ඉතා අත්‍යවශ්‍ය බව අවධාරණය කළේය.<br>ගොවි පුහුණු, ව්‍යාපාර කමිටු, කන්න රැස්වීම්, මහ සභා රැස්වීම්, විශේෂ උත්සව වලදී ගොවි සංවිධාන නිළධාරීන්ගේ සහභාගීත්වය ඉතා වැදගත් බව ද සඳහන් කළේය. | නේවාසික ව්‍යාපාර කළමණාකරු |
| **02.** <u>වාරිමාර්ග කටයුතු</u> | |
| *බදුළුඔය ව්‍යාපාරය* | |
| කන්න රැස්වීම් තීරණ අනුව මාර්තු 30 සහ අප්‍රේල් 20 දින වල ජලය නිකුත් කළ බව පැවසීය.<br>මේ වන විට පහළ කොටස් වල යල කන්නය සඳහා වගා කටයුතු කරමින් පවතින අතර, ඉහළ කොටස් වල සුළු වශයෙන් වගාව ආරම්භ කරමින් සිටින බවක් සඳහන් කළේය.<br>එමෙන්ම ඉදිරියේ දී අධික වියළි කාලගුණයක් පැවතිය හැකි බව ද අවධාරණය කළේය.<br>තවද, වාරි වීකුම් ප්‍රදර්ශනයට සහයෝගය දැක්වූ සැමට ස්තූතිය ප්‍රකාශ කළේය.<br>මව් ඇල හැර කෙත් ඇල හා ඕ ඇලවල් වල නඩත්තු කටයුතු කිරීමට උපදෙස් දුන් අතර, ක්ෂේත්‍ර පරීක්ෂාවට ඉදිරි සතිය තුළ පැමිණීමෙන් පසු නඩත්තු මුදල් ගෙවිය හැකි බවද සඳහන් කළේය. | ඉංජිනේරු සහකාර, බදුළුඔය ව්‍යාපාරය |
| 41 ඇලේ පැති බැම්ම ඉදි කළ යුතු බවත්, එයට වැලි කොට්ට යෙදූවද ගැටළුව විසඳී නොමැති බවත් අද දිනයේ හෝ ක්ෂේත්‍ර පරීක්ෂාවට පැමිණ විසඳුමක් ලබාදෙන ලෙසට ඉල්ලීමක් කළේය. | ගරු සභාපති, ගජබා ගොවි සංවිධානය |
| ඒ සඳහා ඇස්තමේන්තු සකසා දිය හැකි අතර, ගල්, වැලි හෝ සිමෙන්ති වුවද ලබා දීමට හැකි බවත් කීවේය. | ඉංජිනේරු සහකාර, බදුළුඔය ව්‍යාපාරය |
| <u>*බත්මැඩිල්ල ව්‍යාපාරය*</u> | |
| මාර්තු 20, 30 වන විට නඩත්තු කිරීමට තිබුණද ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවූ නිසා, වම ඇලේ අවසන් කොටසේ රොන් මඩ බාගයක් ඉවත් කළ අතර මේ වන විට ප්‍රවේශ ඇලේ රොන් මඩ ඉවත් කිරීම ආරම්භ කර ඇති බව පැවසීය.<br>ඒ අනුව, යල කන්නය ඉක්මනින් ආරම්භ කරන ලෙසත්, ඇල වෙලි ශුද්ධ කිරීම ද අතපසු නොකරන ලෙසත් දැන්වීය.<br>තවද, හැකි ඉක්මනින් ප්‍රධාන ඇලේ නඩත්තු කටයුතු අවසන් කරන බවද සඳහන් කළේය. | ඉංජිනේරු සහකාර, බත්මැඩිල්ල ව්‍යාපාරය |

| | |
|---|---|
| මාස් කන්නයේ වගාවන් පිළිබඳ ගැටළුවක් නැති බව පැවසීය.<br>දැනට ක්‍රියාත්මක වන ජල මුර ක්‍රමය සාර්ථක බවද කීය. | ගරු සභාපති, ගැමුණු ගොවි සංවිධානය |
| පසුගිය කාලයේ නඩත්තු කටයුතු සඳහා ලැබුණු මුදල් ප්‍රමාණවත් නොවූ බව කීය.<br>බත්මැඩිල්ල ව්‍යාපාරයට ලැබීමට තිබූ මුදල් ප්‍රතිපාදනයක් නොලැබීම නිසා ඒ පිළිබඳව ජනාධිපතිතුමාට හා අගමැතිතුමාට දැන්වීමෙන් පසු මිලියන 150ක මුදලක් මෙම ව්‍යාපාරයට වෙන් වන බවත් සඳහන් කර ඒවා ඇති බව දැනුම් දෙන ලදී.<br>පසුගිය දින වල නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය විසින් සංවිධානය කරන ලද වැඩසටහන් වලට මෙන්ම ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානයේ මහ සභාවට ද නොපැමිණි පිරිස පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරන ලදී. | ගරු සභාපති, සුචරිත ගොවි සංවිධානය |
| 2018 යල සඳහා කන්න රැස්වීම් තීරණ අනුව 25% වී, 75 % වෙනත් ආහාර බෝග ලෙස වගාවන් තීරණය කළ ද, මේ වන විටත්, ඇතැම් ස්ථාන වල වී වගාවට යොමුව ඇති බවත්, ඒ අනුව කන්නය ගැටළුසහගත විය හැකි බවත්, පැවසීය.<br>F.C.03 ද මේ වන විට සී සෑම කර තිබූ අතර, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර එම ජල නලය වසා දැමූ බව කීවේය.<br>F.C.09 අනවසර පාරක් සකස් කර තිබීම ගැටළුසහගත බැවින් එයටද යම් විසඳුමක් ගත යුතු බව කීවේය.<br>වගාවන් වල ගැටළු නොමැති බව වැඩිදුරටත් පැවසීය. | |
| F.C.09 ජල නල වාරිමාර්ග දෙපාර්තමේන්තුවට නැවත රැගෙන එන බවත්, ඒවා පුද්ගලික පරිහරණයට ලක් නොවිය යුතු බව පැහැදිළි කළේය. | වාරිමාර්ග ඉංජිනේරු |
| අස්වැන්න ප්‍රමාද වුවත් දැනට ගැටළු නොමැති බව පැවසීය.<br>සහයෝගය දැක්වූ සියළුම නිළධාරි මහතුන්ට ස්තුතිය ප්‍රකාශ කරන ලදී. | ගරු සභාපති, පැරකුම් ගොවි සංවිධානය |
| බත්මැඩිල්ල යාය 03 ඇලේ පවතින ගැටළුව පිළිබඳ පැහැදිළි කළේය.<br>ඒ සඳහා ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසට ද ඉල්ලීමක් කළේය. | ගරු සභාපති, ගැමුණු ගොවි සංවිධානය |
| නව ඉදිකිරීම් වලට වඩා නඩත්තු වලට ප්‍රමුඛතාව ලබා දිය යුතු බවත්, එම කටයුතු සඳහා ගොවි සංවිධාන වල සහයෝගය අවශ්‍ය බවත් පැවසීය.<br>කෙසෙල් ගස්, වැටවල් මායිම් වලට යෙදීමෙන් හානිදායක බව වැඩිවන නිසා ඒවා ඉවත් කරන ලෙසට උපදෙස් දුනි.<br>ගොවි සංවිධාන ඉල්ලීම් වලට අනුව මැද ඇල නඩත්තුව මින් ඉදිරියට වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පවරාගෙන කන්නයකට වරක් නඩත්තු කටයුතු ඉටු කිරීමට ඉදිරියේදී කටයුතු යොදන බව කීය.<br>තවද, එම නඩත්තු මුදල් නැවත ගොවි සංවිධානයට නොගෙවීමට ද තීරණය කර ඇති බව සඳහන් කළේය. | වාරිමාර්ග ඉංජිනේරු |
| මැද ඇල නඩත්තු නොවන්නේ ගොවි සංවිධානයේ අක්‍රිය වීම නිසා බව සඳහන් කළ අතර, දෙපාර්තමේන්තුවට පවරා ගත්තද, ඒ සඳහා ගොවි සංවිධානයේ සක්‍රිය දායකත්වය ඉතා වැදගත් බවද කීය. | ගරු සභාපති, ගැමුණු ගොවි සංවිධානය |

| | |
|---|---|
| 09 ඇලට මීටර් 50 පමණ ඉහළින් ප්‍රධාන ඇල බැම්ම පිටාර ගැලීමට පෙර ඉක්මන් විසඳුමක් යෙදිය යුතු බව කීය. | ගරු ලේකම්, සුචරිත ගොවි සංවිධානය |
| වගාවන් පිළිබඳ විශේෂ ගැටළුවක් නැති බව කීය.<br>2018 වසරට සංවර්ධන යෝජනා දෙකක් ඉදිරිපත් කරන ලදි. | ගරු සභාපති, දිලෙනතරු ගොවි සංවිධානය |
| 01.බත්මැඩිල්ල දකුණු ඉවුර පාලම් දෙක ඉදි කළත් එම ඇල බැම්මෙ වාහන ගමන් කිරීමට හැකිවන ලෙස 75 මීටර් පැති බැම්මක් ඉදිකර පස් පුරවා සකස් කිරීම.<br>02.මුර ක්‍රමය යටතේ ජලය ලබා දෙන නිසා දෙවෙනි කිලෝමීටරයේ ගේට්ටුවක් ඉදිකිරීම. | |
| කලිපිටිගල ජලාශය ඉදිකිරීමෙන් පසුව කළමනාකරණයෙන් යුතුව ජලය පරිභෝජනය ගැන දැනටමත් ගොවීන් දැනුවත් විය යුතු බව පැහැදිළි කළේය. | වාරිමාර්ග ඉංජිනේරු |
| වම් ඉවුරේ 01 කොටසේ කඩාගෙන යන ස්ථාන කීපයක් මැනුම් කටයුතු කළ අතර, ඒවා පිළිසකර කරගත යුතු බව පැවසීය. | ගරු සභාපති, සුචරිත ගොවි සංවිධානය |
| 70% පමණ වී වගා කරන අතර, මෙතෙක් මාස් කන්නයේ වැඩ කොටස් අවසන් නොකළ සුළු පිරිසක්ද සිටින බව කීය.<br>තවද, පාලමක් සහ ඇල පාරක් සකස් කරගත යුතු බව සඳහන් කළේය. | ගරු සභාපති, සමගි ගොවි සංවිධානය |
| **03.** <u>කෘෂිකර්ම සංවර්ධනය</u> | |
| යල කන්නයේ දී විශේෂ වැඩසටහන් කීපයක් සූදානම් කර ඇති බවත්, මෙම සතිය ගොවි සතිය ලෙස නම් කර ඇති බවත් සඳහන් කරන ලදි.<br>25% වී වගා කරන නිසා පැරණුට වගාවට යොමුවන ලෙස දැනුම් දෙන ලදි.<br>එමෙන්ම ජලය අවම භාවිතය සඳහා වගාවන්ට කර දහයියා යෙදීමටද උපදෙස් දෙන ලදි.<br>25% වී වගා කරන්නේ නම් යල කන්නයට අඩු වයස් වී ප්‍රභේද භාවිත කළොත් සාර්ථක කන්නයකට යා හැකි බවත්, කව්පි, උඳු, මුං වැනි රනිල භෝග වගාව ඉතා වැදගත් බවත්, අඹ, ඩ්‍රැගන් ෆෘට වැනි පළතුරු පැළ මෙවන විට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හරහා මිල දී ගත හැකි බවත් පවසන ලදි. | තාක්ෂණික සහයක |
| *වැල්ඩියු ඇන්ඩ් වෝකර් සමාගම* | |
| 108 දෙනෙක් ගොවි පිරිසක් සමඟ 2018 මහ කන්නයේ සාර්ථකව ගර්කින් වලින් ඉහළ ආදායමක් ලබාදුන් අතර, ගර්කින් පැළ 1000ක් වගා කර රු. ලක්ෂයකට වඩා ආදායමක් ලබා ගැනීමට තවත් ගොවි මහතුන්ට එම ආයතනය සමඟ එකතු වන ලෙස ඉල්ලීම කළාය.<br>එමෙන්ම එම කන්නයේ දී කටයුතු සාර්ථක කරගැනීමට උපකාර කළ සියළු ආයතන වල නිළධාරීන්ට ස්තුතිය ප්‍රකාශ කරන ලදි. | ක්ෂේත්‍ර නිළධාරිණී |
| <u>ස්තුතිය</u> | |
| නව තාක්ෂණික ක්‍රම භාවිත කරමින් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් ආදායම වැඩි කරගත හැකි බව සඳහන් කළේය. | නේවාසික ව්‍යාපාර කළමණාකරු |

| | |
|---|---|
| තවද, ඒකාබද්ධ ගොවි සංවිධානයට අරමුදල් රැස් කිරීම වෙනුවෙන් නිකුත් කළ ලොතරැයි වල දිනුම් ඇදීම මැයි 25 දක්වා දීර්ඝ කළ බව ද මතක් කරන ලදී.<br>බදුල්ඔය/ බත්මැඩිල්ල නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ අද දින පැවති ව්‍යාපාර කමිටුවට පැමිණි සියළු දෙනාට ස්තූතිය ප්‍රකාශ කරන ලදී. | |

මෙයට,

..............................

එස්. එච්. එල්. දයාපාල
නේවාසික ව්‍යාපාර කළමණාකරු
බදුල්ඔය / බත්මැඩිල්ල ව්‍යාපාර
කන්දකැටිය

එස්.එච්.එල්.දයාපාල

නේවාසික ව්‍යාපාර කළමණාකරු